

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
சமுத்திர பல்கலைக்கழகம்
The Ocean University of Sri Lanka

2018

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT



නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிசி அமைச்சு
Ministry of Skills Development and Vocational Training

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2018

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

අංක : 15, කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.

දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

අන්තර්ජාලය : www.ocu.lk

පටුන

01. උපකුලපති පණිවුඩය

02. පාලන මණ්ඩලය සහ සංයුතිය

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

04. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය , විකාශය , අරමුණු

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය,සේවා දායකත්වය

06. උසස් අධ්‍යයන අංශය

07. පුහුණු අංශය

08. පාලන අංශය

09. අභ්‍යන්තර විගණන අංශය

10. ශේෂ පත්‍රය සහ ආදායම් වියදම් ගිණුම්

11. විගණකාධිපති වාර්තාව

12. විගණකාධිපති වාර්තාවට කරනු ලැබූ පැහැදිලි කිරීම්

01. උපකුලපති පණිවුඩය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ගමන් මඟ 2018 වසර තුල දී විමසුමට ලක්කර උපකුලපති පණිවුඩය සටහන් තැබීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකනුයේ විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපති ධූර සේවා කාලයේ අවසන් වසර සනිටුහන්ව පවතින අවස්ථාව ද සිහිපත් කරමිනි.

නාවික හා සාගර ක්ෂේත්‍රයට ජාතික හා අන්තර් ජාතික මට්ටමේ නිපුණතාවයෙන් හෙබි විද්‍යාඥයන්, වෘත්තිකයින්, කාර්මිකයින් ලෙස අපගේ පුරවැසියන් ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනයට දායක කිරීමේදී විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන සහ වෘත්තීය පුහුණු අංශයට අතිවිශාල කාර්යභාරයක් පැවරේ. සමාලෝචිත වසර තුලදී උසස් අධ්‍යයන සහ පුහුණු අංශ අත්කර ගෙන ඇති ප්‍රගති තත්ත්වයන් නිරූපිත සංඛ්‍යා දත්ත මඟින් පැහැදිලි වනුයේ තරමක සාධනීය මට්ටමකට ලඟා වී ඇති බවකි. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා 2017 වසරේදී ඇරඹී ගාස්තු අයකිරීමකින් තොර නිදහස් අධ්‍යයන අවස්ථාව ක්‍රමිකව ශිෂ්‍ය ආකර්ෂණය දිනා ගැනීමට ඉවහල් වී ඇති බව පෙනේ. විශ්වවිද්‍යාලයක් ස්ථායි වීමේ පදනම රඳා පවතිනුයේ බඳවා ගනු ලබන ශිෂ්‍ය ප්‍රජාව සඳහා ලබා දිය හැකි මානව සහ භෞතික සම්පත් පහසුකම් මත වන අතර ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශයේ මේ දක්වා නොතිබුණු අත්‍යාවශ්‍යම යටිතල පහසුකම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ, අධ්‍යයන හා අනධ්‍යයන අංශයේ ජ්‍යෂ්ඨ නිලධාරීන්ට අත්‍යාවශ්‍ය සහ ශිෂ්‍ය ප්‍රජාවේ උන්නතිය හා සංවර්ධනය සඳහා කුලී පදනම මත එම පහසුකම් තාවකාලිකව ලබා දීමට හැකි වූ බව මා ප්‍රකාශ කරමි.

එසේම, විශ්වවිද්‍යාලයට අඩුපාඩුවක් වූ ස්ථිර කාර්ය මණ්ඩලයේ කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියක් අනුමත කරවා නාවික ඉංජිනේරු අංශයට, ධීවර හා සාගර විද්‍යා අංශයට, වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ අංශයට , නාවික ප්‍රවාහනය හා (භාණ්ඩ සේවා) සැපයුම් කළමනාකරණ අංශයට ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා කථිකාචාර්යවරුන් බඳවා ගැනීම පමණක් නොව ඔවුන්ගෙන් වැඩිදෙනෙකුට නාවික හා සාගර ක්ෂේත්‍රයේ අත්දැකීම් බහුලව තිබිය යුතු බැවින් කොයිකා (KOICA) ව්‍යාපෘතිය හා අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ පශ්චාත් උපාධි සඳහා දකුණු කොරියාවට යැවීමට කටයුතු කිරීම පිළිබඳ බෙහෙවින් සතුටු වන්නෙමි. එසේම, විශ්වවිද්‍යා ලයට ස්ථිරසාර ෙ ගාඩනැගිලි පහසුකම් ලබාදීම සඳහා කොයිකා (KOICA) ව්‍යාපෘතිය සමඟ අවබෝධතා ගිවිසුමකට එලඹීම මෙම වර්ෂය තුල හැකිවූ තවත් ජයග්‍රහණයක් බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි. තවද එවකට පැවැති ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සිටි සේවක මඩුල්ල විශ්වවිද්‍යා ලයේ අන්තර්ග්‍රහණය කර හැකිතාක් දුරට විශ්වවිද්‍යා ලයේ වැටුප් කේත මෙම කාර්ය මණ්ඩලයට ලබා දීමට yel ùuo මෙම වසර තුල සිදු කර ඇති තවත් කාර්යයකි.

එසේම, පරිපාලන මූල්‍ය හා විගණන අංශවල ප්‍රගති සටහන් මඟින් පැහැදිලි වනුයේ තත්ත්වාගණනය කළ මතයක් අවසන් ගිණුම් සඳහා ලබා ගැනීම තුළ යහපත් මූල්‍ය පාලනයක් පවත්වාගෙන යාමට පරිපාලනමය වශයෙන් ලබා දී ඇති දායකත්වයත්, පවත්නා පාලන පද්ධතීන් පිළිබඳ නිසි විගණනයක් විගණන අංශය මඟින් සිදුකර පද්ධතින් ශක්තිමත් භාවයෙන් ක්‍රියාත්මක වීම සඳහා දිශානතීන් පෙන්නුම් කර ඇති බවත්ය.

2018 වසර තුල විශ්වවිද්‍යාලය ක්‍රියාකාරී වී ඇති මට්ටම පිළිබඳ අධ්‍යයනය කිරීමේදී එකී සියලු අංශයන්ගේ ප්‍රාමාණික වර්ධනය වඩාත් සඵලදායි මාවතකට යොමු කර ගැනීමේ වැදගත්කම පැහැදිලි වනුයේ ඵලදායි කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සැලසීම රටක සංවර්ධන කාර්යභාරයට ඉමහත් බලපෑමක් වන කරුණක් බැවිනි.

සියලු අංශයන්ගේ සාධනීය ලක්ෂණ ඉදිරියට ගෙනයමින් පවත්නා අඩුපාඩු අවම කර සුදුසු විසඳුම් ලබා දීමට ක්‍රියාකර 2019 වසර ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා ජයග්‍රාහී වසරක් බවට පත් කිරීමට කටයුතු කරන බව ද සටහන් තබමි.

නිලක් ධර්මරත්න
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

02. පාලන මණ්ඩලය හා සංයුතිය

01. තිලක් ධර්මරත්න මහතා - උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
(පාලන මණ්ඩල සභාපති)

02. පී. රණේපුර මහතා - ලේකම්,
නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

03. එල්.පී. ජයම්පති මහතා - ලේකම්, වරාය සහ නාවික අමාත්‍යාංශය

04. ජේ.එම්.සී.ජේ. විජේතුංග මහත්මිය - රාජ්‍ය ලේකම් (උසස් අධ්‍යාපන),
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

05. සාලිය වික්‍රමසූරිය මහතා - පාලන මණ්ඩල සාමාජික

06. රොමේෂ් එම්. ඩෙවිඩ් මහතා - පාලන මණ්ඩල සාමාජික

07. ආචාර්ය ආශා ද වොස් මහත්මිය - පාලන මණ්ඩල සාමාජික

08. මහාචාර්ය දයා එදිරිසිංහ මහතා - සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ
සංවර්ධන නියෝජිතායතනය

09. ආචාර්ය ශාන්ත කුමාර ගම්ලත් මහතා - පාලන මණ්ඩල සාමාජික

10. ආචාර්ය සාරාංග අලහප්පෙරුම මහතා - සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික
පුහුණු කිරීමේ අධිකාරිය

11. රවී ජයවර්ධන මහතා - සභාපති, වෘත්තීය පුහුණු අධිකාරිය

12. එන්.බී.එම්. රණතුංග මහතා - අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ),
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

13. ආර්.එම්. විජේසිංහ බණ්ඩා මහතා - අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුව,
මුදල් අමාත්‍යාංශය

14. එල්. සුරේඛා හේවගේ මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

03. ශාස්ත්‍රීය සභාව සහ සංයුතිය

01. තිලක් ධර්මරත්න මහතා (සභාපති) - උපකුලපති, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

02. හේමන්ත රත්නායක මහතා (ලේකම්) - ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

03. ආචාර්ය එම්.පී. කුමාර මහතා - පීඨාධිපති (වැ.බ.), තංගල්ල,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

04. පී.යූ.අයි. පෙරේරා මහතා - අධ්‍යක්ෂ (පුහුණු), ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

05. එච්.කේ.ආර්. තුෂාර මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

06. එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

07. ආචාර්ය චම්පා අමරසිරි මහත්මිය - උසස් අධ්‍යයන අංශ උපදේශිකා,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

08. නිශාන්ති පෙරේරා මහත්මිය - උසස් අධ්‍යයන අංශ උපදේශිකා,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

09. එම්.සී.එල්. සොයිසා මහත්මිය - කථිකාචාර්ය (පරිවාස), විභාග කටයුතු,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

04. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ **ආරම්භය , විකාශය හා අරමුණු**

ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දැනුම ලබා දී රටේ සංවර්ධනය උදෙසා දායකත්වය දීමේ කාර්යභාරය 2014 අංක 31 දරන පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය සටහන් වනුයේ මීගමුව ප්‍රදේශයෙනි. 1963 වර්ෂයේදී මීගමුව ධීවර පුහුණු ආයතනය වශයෙන්ද, 1972 වර්ෂයේදී තංගල්ල, මඩකලපුව, යාපනය ප්‍රදේශ වලින් ආරම්භ වී 1975 වර්ෂයේ මට්ටක්කුලියද, 1993 වර්ෂයේදී ත්‍රිකුණාමලය ද ලෙස ධීවර පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රමික විකාශයකින් පසු 1999 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත මඟින් 1999 දෙසැම්බර් මස 20 වැනි දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය නමින් ස්ථාපිත වී 2006 වර්ෂයේදී ගාල්ල සහ 2008 වසරේදී කළුතර උතුර ප්‍රදේශයේ නව ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාල 02 ක් ව්‍යාප්ත විය. මෙලෙස ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් දසත විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය වර්ධනය වී ඇති අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රයේ පුහුණු මානව සම්පත වර්ධනය කිරීමේ කාර්යභාරයේ පෙර ගමන්කරුවකු බවට පත් වී ඇත.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී පාඨමාලාවද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ගොඩනැඟීම් සහ නාවික නිර්මාණ ශිල්පී විද්‍යාවේදී පාඨමාලාවද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වසරේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද, 2015 වසරේදී වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුල වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසු දරු දරුදැරියන්ට වැඩි උපාධි අධ්‍යයන අවස්ථා ලබා දීමේ දොරටු විවර කර දෙමිනි.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් ශ්‍රී ලාංකික දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත විය.

දැක්ම

ධීවර , සමුද්‍රීය විද්‍යාව සහ නාවික ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනයේ දකුණු ආසියාවේ නායකයෙකු බවට පත් වීම.

මෙහෙවර

ධීවර,නාවික සහ සමුද්‍රීය විද්‍යා ක්ෂේත්‍රයේ වර්තමාන හා අනාගත මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් යුත් අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

01. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

02. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

03. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

04. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

05. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

06. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

07. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

05. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන සහ වෘත්තීය පුහුණු ලෙස අංශ දෙකකින් ක්‍රියාත්මක වේ. පීඨ දෙකකින් සමන්විත උසස් අධ්‍යයන අංශයත්, මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ නියමු මධ්‍යස්ථාන වශයෙන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක් ද වශයෙන් ඇතුළත් වෘත්තීය පුහුණු අංශයත් ශ්‍රී ලාංකික සංවර්ධන කාර්යභාරයට ලබා දෙන දායකත්වය පහත පරිදි වේ.

උසස් අධ්‍යයන අංශය

- ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය
- ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය

වෘත්තීය පුහුණු අංශය

(ප්‍රාදේශීය මධ්‍යස්ථාන)

මීගමුව

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, වැල්ලවිදීය, මීගමුව.

තංගල්ල

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල.

මඩකලපුව

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව.

යාපනය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් වීදිය, ගුරු නගර්, යාපනය.

මට්ටක්කුලිය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදුපත, මට්ටක්කුලිය, කොළඹ 15.

ත්‍රිකුණාමලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩ්බේ, චීන වරාය, ත්‍රිකුණාමලය.

ගාල්ල

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මාගල්ල, ගාල්ල.

කළුතර

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, පාසල් පටුමඟ, දෙදියවල, වස්කඩුව, කළුතර

සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.

- ධීවර,සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අලුතින් අවතීර්ණ වන්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වීමට අපේක්ෂා කරන්නන්
- ධීවර, සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ විෂයයන් ඉගැන්වීම කරන ආචාර්ය මණ්ඩලය සහ උපදේශකවරු

06. උසස් අධ්‍යයන අංශය

සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය මගින් ධීවර හා සමුද්‍රීය විද්‍යා, නාවික ඉංජිනේරු, වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණය , නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමනාකරණය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා 04 ක් ක්‍රියාත්මක වේ . ධීවර හා සමුද්‍රීය විද්‍යා උපාධි පාඨමාලාව තංගල්ල ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨයෙහි පැවැත්වෙන අතර අනෙකුත් උපාධි පාඨමාලා මට්ටක්කුලිය ඉංජිනේරු හා කළමණාකරන පීඨයේ පැවැත්වේ. 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) මත පදනම්ව ද නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය සහ වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණය විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කර ඇත.

වගුව - අංක 1: වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය

විද්‍යාවේදී උපාධි වැඩසටහන්	ශිෂ්‍ය සංඛ්‍යාව						
	2012/ 2013	2013/ 2014	2014/ 2015	2015/ 2016	2016/ 2017	2017/ 2018	2018/ 2019
නාවික ඉංජිනේරු (විද්‍යාවේදී උපාධිය: අවු: 04)	42	40	27	26	40	31	37
ධීවර හා සමුද්‍රීය විද්‍යාව (විද්‍යාවේදී උපාධිය: අවු:03)	27	27	12	43	27	24	41
නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය (විද්‍යාවේදී උපාධිය: අවු: 03)	නැත.	40	30	30	47	41	53
වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණය (විද්‍යාවේදී උපාධිය: අවු:03)	නැත.	නැත.	17	12	40	31	45

වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය



වගුව - අංක 2 විශේෂවේදී උපාධිය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව

විශේෂවේදී උපාධිය	ශිෂ්‍ය සංඛ්‍යාව
ධීවර හා සමුද්‍රීය විද්‍යා විශේෂවේදී උපාධිය	04

වගුව අංක - 3 2018 උපාධිය සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව

උපාධිය	ශිෂ්‍ය සංඛ්‍යාව
ධීවර හා සමුද්‍රීය විද්‍යාව (විද්‍යාවේදී උපාධිය)	49
නාවික ඉංජිනේරු (විද්‍යාවේදී උපාධිය)	56

වගුව අංක 4 - ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨයේ ස්ථීර කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්

1. ආචාර්ය එම්. පී. කුමාර මහතා - B.Sc (Hons), (Ruhuna, SL),Ph.D (Edinburgh Napier,UK)
2. ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා - B.Sc, (M.Phil,Ruhuna, Sri Lanka)D.Sc(Shizuoka, Japan)

කථිකාචාර්යවරුන්

1. ටී.ඩබ්.එස් වර්ණසූරිය මහතා -B.Sc,(Hons) (Ruhuna, Sri Lanka),M.Sc (Colombo,Sri Lanka)
2. එන්. පී. ජී. පුෂ්පිත මහතා - B.Sc, Mphil (Ruhuna, SL)
3. ආචාර්‍ය ලංකා වික්‍රමසිංහ මිය - B.Sc(Hons) (Ruhuna, SL), M.Sc (Vrije, Belgium)
4. එස්. එන්. දුෂානි මිය - B.Sc (Hons) (Ruhuna,SL),M.Sc (Tromso, Norway)
5. බී.ඒ. එන්. ඉන්දිකා මිය - B.Sc (Hons)(Ruhuna, SL), M.Sc (Reading)
6. ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා - B.Sc (Hons),(Ruhuna SL) , M.Sc (James Cook , Australia)
7. එරන්දි පතිරණ මිය - B.Sc (Peradeniya, Sri Lanka), M.Sc (Osaka, Japan), DCSD (NIBM, Sri Lanka)
8. එම්. අයි. යූ. මානික්කආරච්චි මිය - B.Sc. (Hons) (Ruhuna, Sri Lanka)
9. එම්.ටී.ජී. රත්නසූරිය මහතා - B.Sc(Hons) Ruhuna,SL, M.Sc.(Pahyong National University Korea)
10. ඩබ්.ඒ. ශිරාන් චාමික මහතා - B.Sc (Hons), (Ocean University ,Sri Lanka)

වගුව අංක 5 - ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ස්ථීර කාර්ය මණ්ඩලය

<u>නාවික ඉංජිනේරු විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව</u>

කථිකාචාර්යවරුන්

1.පී.ඩී.ඩී. හර්ෂප්‍රිය මහතා - B.Sc. in Ocean University of Sri Lanka

2 .ඒ.එච්.එස්.අයිවීරකෝන් මහතා - B.Sc. in Ocean University of Sri Lanka

3.ආෂික් රාසුල් මහතා - B.Sc. in (Ruhuna, SriLanka) M.Sc. (Agder, Norway)

වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

කථිකාචාර්යවරුන්

1. ඊ.ඒ.කේ.කේ. අමරසේකර මෙනවිය - B.Sc. in Fisheries and Marine Sciences (Ocean University, Sri Lanka), M.Sc. in Aquaculture & Fisheries Management (Kelaniya, Sri Lanka).
2. එම්.සී.එල්. සොයිසා මහත්මිය - B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, Sri Lanka) ,M.Sc. in Aquaculture and Fisheries Management at (Kelaniya, Sri Lanka).
3. පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය.-B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardanapura, Sri Lanka).
4. එච්.ඒ.පී.එස්. ජයපාල මහත්මිය - B.Sc. in Degree (Open University Sri Lanka), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardanapura, Sri Lanka).
5. ඒ. අරුල්නායගම් මහත්මිය - B.Sc.(Special) in Environmental Science Vauniya Campus of the (University of Jaffna), M.Sc. in Environmental Science (Peradeniya, Sri Lanka). (Reading)

වෙරළ සහ සාගර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී Wmdê පාඨමාලාව සඳහා දේශකවරු වශයෙන් දායකත්වය ලබාදී ඇත.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්

1. ආචාර්ය එච්.බී. ජයසිරි මහතා. B.Sc. in Biological Science (Ruhuna, Sri Lanka) M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India)
2. ආචාර්ය.ජේ.කේ. රාජපක්ෂ මහතා. B.Sc. in Physical Science (Peradeniya, Sri Lanka), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya, Sri Lanka)
3. එස්.යූ.ජී.ජිනදාස මහතා.B.Sc. in Special in Geology (Peradeniya, Sri Lanka), (Mphil) Applied Geophysics (Open University Sri Lanka)

නාවික ප්‍රවාහන සහ සැපයුම් කමනාකරණ විද්‍යාවේදී උපාධිය

කථිකාචාර්යවරුන්

1. ඩී.සී. මානගේ මහත්මිය -B.Sc. (Hons.) in Transport & Logistics Management (Moratuwa, Sri Lanka), MBA in Management & Finance (Reading).
2. එච්.ඩී.එම්.එම්. පුස්සැල්ල මෙනවිය - B.Sc. (Hons.) in Business Administration (Peradeniya, Sri Lanka).
3. ටී.ජී.ජී.එන්. අසන්ත ද අල්විස් මහතා - B.Sc. (Hons.) in Transportation & Logistics Management (Moratuwa, Sri Lanka).

ප්‍රගතිය

- වසර තුළ පාඨමාලා ගාස්තු නිදහස් කිරීම හේතුවෙන් පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව ශිෂ්‍ය ලියාපදිංචිය ඉතා ඉහල මට්ටමක පැවතුණ අතර විශේෂවේදී උපාධිය හැදෑරීම සඳහා ලියාපදිංචි වීමද වර්ධනය වී ඇත.
- Z-Score මත සිසුන් ඇතුලත් කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් නිදහස් අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම සාර්ථක වී ඇත.
- ශ්‍රී ලංකාවේ පැවැත්ත් වූ විවිධ විද්‍යාත්මක වැඩමුළු සඳහා සාගර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ශිෂ්‍ය පර්යේෂණ පත්‍රිකා 25 ක් පමණ ඉදිරිපත් කිරීම වසර තුළදී සිදු විය.
- නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨය බදු පදනමට ගත් නව ගොඩනැඟිල්ලක ස්ථාන ගත කිරීමට කටයුතු කරන ලදී.
- අන්තර්ජාලය භාවිතා කරමින් අයදුම්පත් බාගත කිරීමේ පහසුකම් සැලසීම මඟින් සිසුන් බඳවාගැනීම පිළිබඳව තොරතුරු ගොණු කිරීමට පහසුකම් ඇති කරන ලදී.
- 2019 වසරට සිසුන් බඳවා ගැනීමේදී සාගර විද්‍යාව පිළිබඳ නව උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී.
- පුරප්පාඩුව පැවැති කථිකාචාර්ය තනතුරු සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගන්නා ලදී.

- ධීවර හා සමුද්‍රීය විද්‍යාපීඨයේ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා පරිගණක විද්‍යාගාරයක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. මෙම පරිගණක විද්‍යාගාරය මඟින් දුරස්ථ සන්නිවේදනය සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (Remote Sensing & Geographical information System)විෂයයන් ඉගැන්වීමට නියමිතව ඇත.
- වර්තමාන රැකියා වෙළෙඳපොලට සරිලන පරිදි උපාධි පාඨමාලා විෂයමාලා සංවර්ධනය කර යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පියවරයන් හඳුනා ගනු ලැබීය.
- උපාධි පාඨමාලා පවත්වාගෙන යාමට අවශ්‍ය කරන දේශන ශාලා,විද්‍යාගාර සහ පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අවශ්‍ය උපකරණ , ග්‍රන්ථ සපයා ගැනීම වසර තුලදී සිදු කෙරුණි.
- ධීවර හා සමුද්‍රීය විද්‍යාපීඨයේ මත්ස්‍ය ව්‍යුහ විද්‍යා ඒකකයක් පිහිටුවීම මඟින් සිසුන් හට විෂයානුබද්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ඉඩ පහසුකම් ලබා දීම.

07. පුහුණු අංශය

2018 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 තුල පවත්වන ලද පාඨමාලා සඳහා ශිෂ්‍ය සහභාගිත්වය.

ප්‍රාදේශීය මධ්‍යස්ථානය	පාඨමාලාව	ශිෂ්‍ය සංඛ්‍යාව
තංගල්ල	ඩිප්ලෝමා	14
	සහතික පත්‍ර	94
	වෙනත්	77
මට්ටක්කුලිය	ඩිප්ලෝමා	44
	සහතික පත්‍ර	83
	වෙනත්	475
මීගමුව	ඩිප්ලෝමා	16
	සහතික ප ;	246
	වෙනත්	75
ගාල්ල	ඩිප්ලෝමා	-
	සහතිකපත්‍ර	71
	වෙනත්	138
යාපනය	ඩිප්ලෝමා	14
	සහතික පත්‍ර	128
	වෙනත්	81
කළුතර	ඩිප්ලෝමා	07
	සහතික පත්‍ර	130
	වෙනත්	-
ත්‍රිකුණාමලය	ඩිප්ලෝමා	-
	සහතිකපත්‍ර	42
	වෙනත්	12
මඩකලපුව	ඩිප්ලෝමා	28
	සහතික පත්‍ර	377
	වෙනත්	20



	තංගල්ල	මට්ටක්කුලිය	මීගමුව	ගාල්ල	යාපනය	කළුතර	ත්‍රිකුණාමලය	මඩකලපුව
ඩිප්ලෝමා	14	44	16		14	7		28
සහතික පත්‍ර	94	83	246	71	128	130	42	377
වෙනත්	77	475	75	138	81		12	20

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



<u>2018 වර්ෂයේදී වෘත්තීය පුහුණු අංශය ලබාගත් ජයග්‍රහණයන් පහත පරිදි වේ.</u>

❖ බදු පදනම යටතේ පවත්වා ගෙන යනු ලබන කළුතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙනුවට ස්ථිර පදනම යටතේ ගොඩනැඟිලි ඉදිකිරීමට පානදුර නගරයෙන් ඉඩමක් ලබාගත් අතර නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ මිලියන 124ක වියදමින් මහල් 04ක ගොඩනැගිල්ලක් 2017 වසරේ ඉදිකිරීම ආරම්භ කරන ලද අතර 2018 වර්ෂය අවසන් වනවිට 75%ක වැඩ අවසන් කර ඇත.

❖ ස්ථිර ගොඩනැඟිලි පරිශ්‍රයක් නොමැතිව කුලී පදනම යටතේ පවත්වාගෙන යන ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙනුවට විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති බූස්ස ප්‍රදේශයේ ගොඩනැඟිලි භාවිතයට ගතහැකි පරිදි අලුත්වැඩියා කිරීම ආරම්භ කිරීම.

❖ පාඨමාලා අවසානයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන මඟින් රැකියාගත පුහුණු ආයතන සඳහා සිසුන් අනුයුක්ත කිරීම.

❖ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 මඟින්ම තොරතුරු ලබා ගැනීම සඳහා කළමණාකරන තොරතුරු පද්ධතියක් (Management Information System (MIS)) ක්‍රියාත්මක කිරීම.

❖ මධ්‍යස්ථාන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති (Quality Management System -QMS) හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම තුල විධිමත් කළමනාකරනයකින් යුතු ඵලදායී සේවාවක් අභ්‍යාසලාභීන්ට ලබා දීමට ක්‍රියා කිරීම.

❖ දිවයින පුරා සිටින බහුදින ධීවර යාත්‍රා නියමුවන් 953ක් සඳහා ධීවර යාත්‍රා නියමු පුහුණුව ලබා දීම.

<u>වෘත්තීය පුහුණු අංශයේ ශිෂ්‍ය සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග</u>

❖ ධීවර ප්‍රජාව පාඨමාලා පිළිබඳ දැනුවත් කර ධීවර දරුදැරියන් හට පාඨමාලා හැදෑරීමට අවකාශ සලසා දීම.

❖ දිවයින පුරා විසිර සිටින සේවා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් මඟින් පාඨමාලා පිළිබඳ විස්තරාත්මක තොරතුරු පල කිරීම මඟින් පාඨමාලා සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමේ වර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කිරීම.

❖ ප්‍රාදේශීය මධ්‍යස්ථාන විසින් තම බල ප්‍රදේශයන්ට අයත් රාජ්‍ය පාසල් වල සිසුන්, ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

08. පාලන අංශය

<u>පාලන අංශය යටතේ ක්‍රියාත්මක උප අංශයන්ගේ ප්‍රගතිය:</u>

- **<u>මානව සම්පත් අංශය</u>**

විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ හා ඵලදායී කාර්යශූර කාර්ය මණ්ඩලයක් බිහි කිරීමේ අරමුණින්, අවශ්‍ය පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම සිදු කෙරෙන අතරම මනා විනය පද්ධතියකින්ද යුක්තව සේවක මණ්ඩල කළමනාකරණය සිදු කරයි.

01. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අවශ්‍ය කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.

02. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ග්‍රහණය නොවූ කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමට අදාළ යෝජනාවලිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

03. සේවකයන්ගේ ධාරිතාව වර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම.

04. පුහුණු අවශ්‍යතා සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

05. විදේශීය පුහුණුව සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

ඒ අනුව, 2018.01.01 දින සිට 2018.12.30 දින දක්වා කාර්ය මණ්ඩලය පහත පරිදි දැක්විය හැකිය.

සේවක		**2018.01.01 – 2018.12.30**		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජ්‍යෙෂ්ඨ මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	34	17	51
	කොන්ත්‍රාත් පදනම	1	2	3
	අනියම්	0	0	0
	*එකතුව**(1)***	35	19	54
2. තෘතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	16	4	20
	කොන්ත්‍රාත් පදනම	16	10	26
	අනියම්	0	0	0
	*එකතුව**(2)***	32	14	46
3. ද්විතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	24	31	55
	කොන්ත්‍රාත් පදනම	0	0	0
	අනියම්	0	0	0
	*එකතුව**(3)***	24	31	55
4. ප්‍රාථමික මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	68	09	77
	කොන්ත්‍රාත් පදනම	02	00	02
	අනියම්	01	00	01
	*එකතුව/ **(4)***	71	09	80
සේවක එකතුව (1)+(2)+(3)+(4)		**162**	**73**	**235**

➢ <u>ප්‍රවාහන අංශය</u>

01. ගර්හිත තත්ත්වයේ පැවැති පහත සඳහන් රථවාහන 06 අපහරණය කිරීමේ කටයුතු වසර තුලදී සිදු කර ඇත.

ස්ථානය	රථයේ වර්ගය	රථවාහන අංකය
ප්‍රධාන කාර්යාලය	කාර් රථය බස් රථය යතුරුපැදිය	17-3404 29-5408 126-6727
මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය	කැබ් රථය බස් රථය යතුරු පැදිය	50-6189 29-5410 GL-0361

- තංගල්ල ප්‍රාදේශීය විද්‍යාලයේ ගර්හිත තත්ත්වයේ පැවැති රථ වාහන 02 ක් අපහරණය කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පියවරයන්හි අවසන් අදියර දක්වා වසර තුළ දී ක්‍රියාත්මක කෙරුණි.

රථයේ වර්ගය	රථවාහන අංකය
බස් රථය	29-5407
යතුරුපැදිය	126-6057

- ප්‍රධාන කාර්යාලය සතුව පවත්නා පහත සඳහන් රථවාහන 02 අපහරණ කටයුතු සඳහා අදාල මූලික පියවර ආරම්භ කරන ලදී.

රථයේ වර්ගය	රථවාහන අංකය
ජීප්රථය	64 - 5796
ලොරි රථය	42- 1677

- ප්‍රධාන කාර්යාලයේ වාහන සංචිතයට අයත් NB 4255 බස්රථය අලුත්වැඩියා කිරීම.

09. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ දැක්ම

මූල්‍ය කටයුතු, පාලන කටයුතු හා සංවර්ධන ක්‍රියාකාරකම් හි පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ අඛණ්ඩ හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යමින්, එකී ක්‍රියාවලියට සම්බන්ධ වී නිවැරදී කිරීමේ ක්‍රියාමාර්ගයන් නිර්දේශ කිරීම මඟින් යහපාලනය අර්ථවත් කිරීම සඳහා දායකවීම.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්

- අභ්‍යන්තර පාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වයන් සාර්ථක දැයි සෙවීම.
- නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයේ පැවරුම් කාර්යන් ඉටුවේ දැයි සෙවීම.
- වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත්තේ දැයි සෙවීම.
- නීති රීති ක්‍රියාපටිපාටි අනුගමනය කරන්නේ දැයි සෙවීම.
- නාස්තිය, දූෂණය, අනවශ්‍ය වියදම් වැළැක්වීමේ පාලන ක්‍රම පවතින්නේ ද යන්න සෙවීම.
- වත්කම් අරපිරිමැසුම් දායකව පරිහරණය කරන්නේ ද යන්න විමසීම.
- විශේෂ විමර්ශන පැවැත්වීම.
- කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් මෙහෙයුම් කටයුතු පිරික්සීම.
- ඉලක්ක සාධකයන් විමසීම.

දිවයිනේ අනෙකුත් විද්‍යාල සියල්ල ආවරණය වන පරිදි විගණන හා විමර්ශන රාජකාරී කටයුතු සිදු කෙරෙමින්, ආයතනයේ මූල්‍ය හා පරිපාලනය නිවැරදි මාවතක් කරා මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කෙරේ.

විගණන අංශයේ ප්‍රගතිය

- අභ්‍යන්තර විගණන වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තර විගණන විමසුම් 23 ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විගණන කළමනාකරණ කමිටු පවත්වා ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සමාලෝචනය කිරීම.

අභ්‍යන්තර විගණන විමසුම්



10. අවසන් ගිණුම

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
2018 දෙසැම්බර් 31 වැනි දින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2018 රු.ශත		2017 රු.ශත	
වත්කම්					
ස්ථාවර වත්කම්					
දේපළ පිරියත උපකරණ	9	592,759,143		525,409,154	
			592,759,143		525,409,154
ජංගම වත්කම්					
සේවක ණය	10	12,540,685		12,008,231	
ඉන්වෙන්ට්‍රි	11	1,799,717		1,024,689	
වෙළඳ සහ වෙනත් (ලැබිය යුතු)	12	77,829,168		63,306,415	
අවිනිශ්චිත		85,433		85,433	
මුදල් හා මුදල් හා සමාන දෑ	14	15,749,150	108,004,153	3,262,800	79,687,568
මුළු වත්කම			700,763,296		605,096,722
ස්කන්ධය හා වගකීම්					
ප්‍රාග්ධන සංචිත					
සමුච්චිත අරමුදල	15	830,564,132		749,318,173	
සමුච්චිත අරමුදල - ආංශික සංවර්ධන වැඩසටහන	15.1	201,422,283		166,331,014	
සමුච්චිත -අනිරික්තය/(ඌණතාවය)	16	(445,391,295)		(435,126,654)	
			586,595,120		480,522,533
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික සඳහා වෙන් කිරීම		45,331,680		33,775,589	
			45,331,680		33,775,589
ජංගම වගකීම්					
උපචිත ගෙවීම්	17	55,834,256		87,206,982	
වෙනත් ගෙවීම්	18	13,002,239		3,591,619	
			68,836,495		90,798,601
මුළු වගකීම්			700,763,296		605,096,723

Hemantha Ratnayake
MBA (PiM) MA (U OF C) BA (Def Studies) psc
Registrar
Ocean University of Sri Lanka
Crow Island, Colombo 15,
Sri Lanka.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදල් ප්‍රවාහය

	31/12/2018 රු.ශත	31/12/2017 රු.ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇති වූ මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුලින් සිදුවූ ඌණතාවය හා අතිරික්තය	(5,016,544)	21,768,782
මූල්‍ය නොවන හැසිරීම්		
ප්‍රාග්ධන අරමුදල් - ගැලපීම	38,495,591	
පාරිතෝෂික දීමනා	12,294,349.00	
ක්ෂය කිරීම්	59,520,686	47,915,337
පෙර වර්ෂයේ ගැලපීම්	23,324,267	(47,915,337)
ක්‍රමක් ක්ෂය	(59,520,686)	9,723,439
	69,097,663	31,492,221
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර මෙහෙයුම් ලාභය		
ඉන්වෙන්ට්‍රි -වැඩිවීම	(775,028)	63,473
ලැබිය යුතු ශේෂ -අඩු වීම	(15,055,206)	(38,814,007)
ගෙවිය යුතු වියදම් -අඩුවීම	(21,962,106)	39,494,816
	(37,792,341)	744,282
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද මුදල්		
පාරිතෝෂික ගෙවීම්	(738,258)	(12,306,808)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	30,567,064	19,929,695
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායෑම		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(155,443,039)	(135,872,524)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(155,443,039)	(135,872,524)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් සිදුවූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන අරමුදල්	109,000,000	52,750,000
ප්‍රාග්ධන ප්‍රධාන (ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන)	28,362,319	34,358,174
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් සිදුවූ මූල්‍ය ප්‍රවාහය	137,362,319	87,108,174
මුදල් හා මුදල් සමාන කිරීම් සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	12,486,344	(28,834,655)
ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානකම්	3,262,800	32,097,454
අවසානයේ දී මුදල් සහ මුදල් සමානකම්	**15,749,150**	**3,262,799**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2018 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

	රජයේ ප්‍රධාන	ආංශික සංවර්ධනඅංශයේ ප්‍රධාන	සමුච්චිතඅතිරික්තය (ඌණකාවය)	එකතුව
2017 ජනවාරි 01 ට ශේෂය	**736,621,992**	**139,834,358**	**(466,618,875)**	**409,837,475**
වාර්ෂික ලාභය			21,768,782	21,768,782
වාර්ෂික රජයේ ප්‍රධාන ලැබීම්	52,750,000	34,358,175		87,108,175
පෙර වර්ෂයේ ගැලපීම්			9,723,439	9,723,439
විලම්භිත ආදායම්	(40,053,819)	(7,861,518)		(47,915,337)
2017 දෙසැම්බර් 31 ශේෂය	**749,318,173**	**166,331,014**	**(435,126,654)**	**480,522,533**
වාර්ෂික ලාභය			(5,016,544)	(5,016,544)
පෙර වර්ෂයේ ගැලපීම්			(5,248,097)	(5,248,097)
වාර්ෂික රජයේ ප්‍රධාන ලැබීම්	115,584,250	39,698,660		155,282,910
විලම්භිත ආදායම්	(54,913,291)	(4,607,391)		(59,520,683)
2018 දෙසැම්බර් 31 ශේෂය	**809,989,132**	**201,422,283**	**(445,391,296)**	**566,020,120**

2018 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	සටහන	2018 රු.ශත	2017 රු.ශත
මෙහෙයුම් ආදායම්			
රජයේ ප්‍රධාන	**1**	309,048,000	247,161,000.00
වෙනත් ආදායම්		11,575,725	17,775,768.84
ආංශික සංවර්ධන අංශය- පුනරාවර්ථන		5,260,073	4,753,879.18
මෙහෙයුම් ආදායම		325,883,797	269,690,648.02
විලම්භීත ආදායම ක්‍රමක්ෂය ගැලපීම්		59,520,683	47,915,337.22
		385,404,480	317,605,985.24
මෙහෙයුම් වියදම්			
පුද්ගල නඩත්තු වියදම්	**2**	223,470,891	164,334,233.19
ගමන් වියදම්	**3**	2,733,151	2,402,417.77
සැපයුම්	**4**	8,946,878	7,437,971.08
නඩත්තු	**5**	5,127,480	3,665,947.16
ගිවිසුම්ගත සේවාවන්	**6**	67,556,151	40,955,931.50
පුහුණු වියදම්	**7**	19,709,580	25,142,113.79
වෙනත් වියදම්	**8**	3,356,208	3,983,251.65
වාර්ෂික ක්ෂය	**9**	59,520,686	47,915,337.22
මුළු වියදම		390,421,024	295,837,203.36
ශුද්ධඅතිරික්ත/ඌණතාවය		**(5,016,544)**	**21,768,781.88**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ගිණුමේ සටහන

		රු.ශත	රු.ශත
සටහන් 1	**ආදායම්**	**2018**	**2017**
	ආපදා ණය පොළී	447,735	340,468
	අසංවිධිත ආදායම	5,377,430	1,304,285
	<u>පාඨමාලා ගාස්තු</u>		
	උසස් අධ්‍යාපනය	1,189,350	1,056,985
	විද්‍යාල ආදායම	4,216,632	14,569,759
	නිවාස කුලී ආදායම	344,578	504,271
		11,575,725	17,775,769
සටහන් 2	**පුද්ගල නඩත්තු වියදම්**		
	වැටුප් හා වේතන	96,794,028	58,962,298
	සේවක භාර අරමුදල	14,915,202	18,384,575
	සේවක අර්ථ සාධක අරමුදල	3,635,044	4,115,123
	වෙනත් දීමනා	76,052,977	67,072,938
	අතිකාල ගෙවීම්	6,237,748	3,509,752
	පාරිතෝෂික වෙන් කිරීම්	12,294,349	-
	ආංශික සංවර්ධන අංශය -කාර්ය සාධනය මත ගෙවීම්	-	432,520
	භාණ්ඩ කර්මාන්තාර්ය ගාස්තු	13,541,544	11,857,026
		223,470,891	164,334,233
සටහන් 3	**ගමන් වියදම්**		
	ගමන් වියදම්	2,065,289	1,597,442
	විදේශ ගමන් වියදම්	667,862	804,975
		2,733,151	2,402,418
සටහන් 4	**සැපයුම්**		
	ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ	4,891,849	3,905,873
	වාහන සඳහා ඉන්ධන සහ ලිහිසි තෙල්	3,587,865	3,107,871
	පිරිසිදු කිරීම සහ වෙනත් ද්‍රව්‍ය	93,568	70,628
	වෛද්‍යාධාර	373,597	353,600
		8,946,878	7,437,971
සටහන් 4.1	**ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ**		
	ආරම්භක තොගය	1,024,689	1,088,162
	එකතුකළා- වාර්ෂික මිලදී ගැනීම්	5,666,876	3,842,400
	අඩුකළා - අවසාන ශේෂය	(1,799,717)	(1,024,689)
	වාර්ෂික පරිභෝජනය	4,891,849	3,905,873

සටහන් 5 නඩත්තු වියදම්

වාහන	2,688,408	1,625,671
ගොඩනැගිලි	979,917	929,818
යන්ත්‍ර සූත්‍ර	152,269	263,030
යාත්‍රා		18,021
කාර්යාල උපකරණ	1,306,887	829,408
	5,127,480	3,665,947

සටහන් 6 ගිවිසුම්ගත සේවාවන්

දුරකථන	6,583,256	7,525,717
තැපැල්	263,670	260,989
ප්‍රවාහන	1,919,156	1,420,864
විදුලිය	6,746,526	5,547,657
ජලය	2,296,599	2,688,640
ගාස්තු හා බදු	24,348,087	7,836,259
වෙනත්	2,096,271	59,795
ආරක්ෂක	14,076,633	9,543,139
පිරිසිදු කිරීම්	7,805,493	6,072,873
විගණන ගාස්තු	1,420,460	
	67,556,151	40,955,932

සටහන් 7 පුහුණු

විශ්වවිද්‍යාල සඳහා වූ වියදම්	8,646,297	11,475,409
විද්‍යාල සඳහා වියදම්	4,915,817	7,584,582
ව්‍යාපෘති වියදම්		
මානව සම්පත් ධාරිතාව ගොඩනැංවීමේ කටයුතු	887,393	1,760,763
පුනරාවර්ථන වියදම් -ආංශික සංවර්ධන අංශය	5,260,073	4,321,359
	19,709,580	25,142,114

සටහන් 8 වෙනත් වියදම්

සුභසාධනය	1,389,311	1,244,746
විනෝදාස්වාදය	1,218,787	1,375,797
මණ්ඩල රැස්වීම වියදම්	450,677	772,594
බැංකු ගාස්තු	36,534	35,705
උපෙද්ශන	188,523	193,485
නීති ගාස්තු සහ වෙනත් දීමනා	52,583	291,360
නිල ඇදුම් සඳහා වියදම්	19,794	26,035
නාරා ප්‍රවාහනය	-	43,530
	3,356,208	3,983,252

සටහන - 09 - දේපළ පිරියත හා උපකරණ

විස්තරය		01.01.2018 දිනට ශේෂය	වසර තුළදී අත්පත් කර ගැනීම / (විකිණීම)	වාර්ෂික ක්ෂය	සමුච්චිත ක්ෂය 31.12.2018	ශේෂය 31.12.2018
ඉඩම් හා ඉඩම් සංවර්ධන	2105	7,939,174.75		793,917.48	2,932,277.36	5,006,897.39
ගොඩනැගිලි - පුනරුත්ථාපනය	2001/01	131,931,892.58	8,536,132.48	6,615,638.82	66,165,048.70	74,302,976.36
යටිතල පහසුක්ම් - මීගමුව ජැටිය	2001/02	379,687.57		18,984.38	341,718.44	37,969.13
මිලදී ගැනීම් - යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	2103	104,541,333.72		10,454,133.37	60,995,726.17	43,545,607.55
මිලදී ගැනීම්- ගොඩනැගිලි	2104	173,820,977.04	10,145,339.90	8,691,048.85	30,210,202.38	153,756,114.56
පුනරුත්ථාපනය - බෝට්ටු හා යාත්‍රා	2005/02	11,832,028.02		1,183,202.80	10,705,468.77	1,126,559.25
ධීවර යන්ත උපකරණ	2107/02	37,273,126.17		3,727,312.62	29,912,591.53	7,360,534.64
ලී බඩු හා සවිකිරීම්	2102	62,321,864.50	40,420,014.99	6,754,307.88	33,983,878.34	68,758,001.15
නාම පුවරු	2106/02	969,114.80	490,000.00	105,078.15	795,109.29	664,005.51
පුස්ථකාලය සඳහා පොත්	2107/03	19,786,095.14	6,220,950.24	1,989,449.56	10,723,140.65	15,283,904.73
වෙනත් වත්කම්	2106/00	8,130,933.72	136,340.00	813,093.37	1,949,274.35	6,317,999.37
පුනරුත්ථාපනය - වාහන	2003	21,921,296.27	792,674.34	4,125,326.32	22,713,969.61	1.00
පරිගණක	2103/03	31,211,625.93			31,211,624.93	1.00
මිලදී ගැනීම් - වාහන	2101	15,214,453.02	27,159,250.00	1,131,635.42	16,346,087.44	26,027,615.58
රසායනාගාර උපකරණ	2107/04	9,728,427.82		972,842.78	8,531,817.74	1,196,610.08
පුනරුත්ථාපනය - කාර්යාල උපකරණ	2004/00	2,750,514.17	200,693.15	285,086.07	928,954.12	2,022,253.20
පුනරුත්ථාපනය-යන්ත්‍ර හා සූත්‍ර	2002	2,715,688.56		271,568.86	1,896,061.30	819,627.26
පුහුණු උපකරණ	2107	64,255,800.27	646,389.85	6,439,692.92	21,464,123.60	43,438,066.52
පුනරුත්ථාපනය - පුහුණු උපකරණ	2005/00	8,849,670.43		884,967.04	2,971,014.34	5,878,656.09
මීගමුව-නේවාසිකාගාර ගොඩනැගිල්ල	2104/02	37,436,137.51		1,871,806.88	6,551,324.08	30,884,813.43
සභාපති ගොඩනැගිල්ල	2104/03	20,185,385.00		1,009,269.25	3,027,807.75	17,157,577.25
යාපනය - ගොඩනැගිල්ල	2104/03	27,646,398.62		1,382,319.93	4,953,313.08	22,693,085.54
එකතුව	(A)	**800,841,625.61**	**94,747,784.95**	**59,520,685.75**	**369,310,533.97**	**526,278,876.59**

Note - 09.01 ක්‍රියාත්මකව පවතින කාර්යයන්

විස්තරය		01.01.2018 දිනට ශේෂය	වසර තුළදී අත්පත් කර ගැනීම / (විකිණීම)	වාර්ෂික ක්ෂය	සමුච්චිත ක්ෂය 31.12.2018	ශේෂය 31.12.2018
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - පානදුර	2104-5	34,357,376.61	20,080,351.94			54,437,728.55
බුස්ස ගොඩනැඟිල්ල වැඩ ප්‍රගතිය	2104-6		12,042,537.60			12,042,537.60
එකතුව	(B)	**34,357,376.61**	**32,122,889.54**			**66,480,266.15**
මුළු එකතුව		**835,199,002.22**	**126,870,674.49**		**369,310,533.97**	**592,759,142.74**

සටහන් 10 සේවක ණය

ආපදා ණය	12,206,667	11,665,463
උත්සව අත්තිකාරම්	141,804	150,554
පොත් ණය	750	750
සුනාමි ණය	191,464	191,464
	12,540,685	12,008,231

සටහන් 11 31/12/2018 දිනට තොගය

ලිපි ද්‍රව්‍ය	1,799,717	1,024,689
	1,799,717	1,024,689

සටහන් 12	**ලැබිය යුතු ශේෂ**		
	ආපසු ගෙවන තැන්පතු (විදුලිබල නාරා)	218,750	218,750
	ආපසු ගෙවිය යුතු තැන්පතු (වාහන කුලී)	47,000	47,000
	අත්තිකාරම්	3,742,168	3,760,668
	නේවාසිකාගාර සඳහා තැන්පතු	1,708,500	1,708,500
	ලැබිය යුතු -පාඨමාලා ගාස්තු -විශ්වවිද්‍යාලය	15,092,123	15,754,623
	වැටුප් අත්තිකාරම්	116,500	121,500
	ලැබිය යුතු -නේවාසික ගාස්තු -විශ්වවිද්‍යාලය	2,892,804	3,325,054
	නාරා අත්තිකාරම	930,593	930,593
	ආපසු ගෙවිය හැකි නේවාසික ගාස්තු	110,000	110,000
	ගමන් අත්තිකාරම්	15,000	15,000
	සිලෝන් ඔක්සිජන්	18,635	18,635
	නැවත ලැබිය යුතු -ටෙන්ඩර් තැන්පතු		
	නාරා-තැන්පත්	180,000	180,000
	විගණන ගාස්තු	62,702	67,248
	නැවත ලැබිය යුතු - තැන්පතු	126,920	291,260
	නේවාසික - තැන්පතු	400,000	400,000
	නැවත ලැබිය යුතු - ගොඩනැගිලි තැන්පතු	18,400,000	27,600,000
	තැන්පතු	-	456,731
	සුභසාධනය	10,500	500
	ණය හිමියන්ට ගෙවීම්	-	8,153,444
	ලැබිය යුතු ප්‍රධාන - ආංශික සංවර්ධන අංශය	12,862,508	146,910
	අත්තිකාරම් ගෙවීම් - බුස්ස ගොඩනැගිල්ල	2,053,364	-
	අත්තිකාරම් ගෙවීම් - පානදුර ගොඩනැගිල්ල	18,841,101	-
		77,829,168	63,306,415
සටහන් 13	**ස්කන්ධය වෙනස් වීම් ප්‍රකාශණය**		
සටහන් 14	**අතැති මුදල් (බැංකු)**		
	බැංකු මුදල්- මහජන බැංකුව-9868	13,184,971	1,242,478
	බැංකු මුදල්- මහජන බැංකුව-9909	2,564,179	2,020,322
		15,749,150	3,262,800
සටහන් 15	**සම්මුචිත අරමුදල**		
	ආරම්භක ශේෂය	749,318,173	736,621,992
	එකතු කළා වාර්ෂික රජයේ ප්‍රධාන	109,000,000	52,750,000
	ක්‍රමක්ෂය ගැලපීම	20,575,000	
	අවසාන ශේෂය	(54,913,291)	(40,053,819)
	අවසන් ශේෂය	823,979,882	749,318,173
	වෙනත් ආයාතන මඟින් ලැබූ අරමුදල්	6,584,250	
		830,564,132	
සටහන් 15.1	ආරම්භක ශේෂය	166,331,014	139,834,358
	ආංශික සංවර්ධන අංශය-වාර්ෂික ලැබීම් ප්‍රධාන	39,698,660	34,358,175
	ක්‍රමක්ෂය ගැලපීම්	(4,607,391)	(7,861,518)
	අවසාන ශේෂය	201,422,283	166,331,014

සටහන් 16 සමුච්චිත ඌණතාවය/අතිරික්තය

ආරම්භක ශේෂය.සමුච්චිත ඌණතාවය/අතිරික්තය	(435,126,654)	(466,618,875)
එකතු කළා:ඌණතාවය/අතිරික්තය	(5,016,544)	21,768,782
පෙර වර්ෂයේ ගැලපීම්	(5,248,097)	9,723,439
අවසාන ශේෂය	(445,391,295)	(435,126,654)

සටහන් 17 උපචිත විදම්

උපචිත වියදම්	30,353,021	5,989,432
උපචිත වියදම්	25,481,234	81,217,500
2018 වර්ෂය සඳහා වූ උපචිත වියදම්	55,834,256	87,206,982

සටහන් 18 නැවත ගෙවිය යුතු වියදම්

රදවා ගැනීම්	9,246,126	2,006,144
නැවත ගෙවිය යුතු -ටෙන්ඩර් තැන්පතු	461,826	781,485
නැවත ගෙවිය යුතු -පුස්තකාල තැන්පතු	964,000	453,000
නැවත ගෙවිය යුතු -විද්‍යාගාර තැන්පතු	452,000	217,000
නාරා ප්‍රවාහන	-	20,000
මුද්දර ගාස්තු	21,250	
උපයන විට ගෙවීම්	3,090	3,090
ගෙවිය යුතු ගාස්තු	3,700	3,700
නැවත ගෙවිය යුතු නේවාසිකාගාර ගාස්තු	107,200	107,200
විගණන ගාස්තු	1,353,213	
ණය හිමියන්ට ගෙවීම්	388,434	
වෙනත් ගෙවීම්	1,400	
	13,002,239	3,591,619

11. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VTY/G/OUSL/2018/අ.සි/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 ඔක්තෝබර් 10 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත් - 1. ලේකම් , කාර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීන අවතැන් පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

2. ලේකම් , මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naod.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VTY/G/OUSL/2018/අ.හි/02 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 ඔක්තෝබර් 10 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>තත්ත්වාගණනය කල මතය</u>

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 <u>තත්ත්වාගණනය කල මතය සඳහා පදනම</u>

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සැලකිය යුතු තරමේ වෙනස්වීම් වන විට ප්‍රත්‍යාගණනයක් සිදු කල යුතු අතර සාධාරණ වටිනාකම සැලකිය යුතු නොවන තරමේ වෙනස් වීම් ඇති විට පැම වර්ෂ තුනකටම හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයනයේ දක්වා තිබූ ශුද්ධ වටිනාකම රු.526,278,876 ක් වූ විශ්ව විද්‍යාලයේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එමෙන්ම පුනරාවර්තන ස්වභාවයේ වාහන අළුත්වැඩියා හා නඩත්තු වියදම් රු. 792,674 ක් හා පුවත්පත් දැන්වීම් වියදම් රු. 578,640 ක් ප්‍රමිතයෙහි 21 වගන්තියට පටහැනි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 47,875,010 ක් වූ වත්කම් අයිතම 04 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.එම වත්කම් තුල ඇතුළත් පිරිවැය රු. 1,076,476 ක් වූ වත්කම් අයිතම 02 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල වත්කම් උපලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Poldowa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු ප්‍රමාණය පමණක් වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කිරීම වෙනුවට 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල ගෙවිය යුතු එකතුව රු. 1,420,460 ක් වූ විගණන ගාස්තු ප්‍රමාණය වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනයට ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(ඈ) 2015 හා 2016 වර්ෂවල දී ප්‍රදාන ලෙස ලැබී තිබූ වටිනාකම රු. 27,159,250 ක් වූ වාහන 04 කට අදාල සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය රු. 6,790,812 ක් වුවද එය රු. 1,131,635 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු. 5,659,177 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. තවද එම වාහන භාවිතයට ගත් දින සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය වටිනාකම රු. 10,622,562 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) උපචිත වියදම් යටතේ උපාධි ලෝගු මිලදී ගැනීම සඳහා පසුගිය වර්ෂයේ දී රු. 1,092,250 ක වෙන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ ඊට අදාල ගෙවීම් කිරීමේ දී අදාල උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට ලී බඩු හා සවි කිරීම් ගිණුමට හර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පානදුර විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් වල කළ වැඩ වටිනාකම රු. 7,627,445 ක් වුවද කොන්ත්‍රාත්කරුට ගෙවන ලද ශුද්ධ මුදල වූ රු. 5,945,365 පමණක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබීම නිසා කෙරී ගෙන යන වැඩ ගිණුමේ ශේෂය හා අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 1,682, 080 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ත්‍රිකුණාමලය විද්‍යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියාව වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දින පලාත් ඉංජිනේරු කාර්යාලය වෙත වෙත ගෙවන ලද රු. 5,700,000 ක මුදල අත්තිකාරම් ගිණුමට හර කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ පෙර වර්ෂවලට අදාල හිඟ පාඨමාලා ගාස්තු ආදායම රු. 225,000 ක් හිඟ පාඨමාලා ගාස්තු ආදායමට බැර කිරීම වෙනුවට වර්ෂයේ පාඨමාලා ගාස්තු ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(එ) පසුගිය වර්ෂයේ වැඩිපුර ගෙවා තිබූ රු. 319,777 ක කුලී මුදල් සමාලෝචිත වර්ෂයේ නැවත මුදලින් ලැබීමේදී පූර්ව වර්ෂ ගැලපුම් ගිණුමට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ බදුකුලී ගිණුමට බැර කර තිබුණි.

(ඒ) උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබූ පෙර වර්ෂ වලට අදාල ඉදිකිරීම් දෙකක් වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,938,566 ක් නිරවුල් කිරීමේ දී උපචිත වියදම් ගිණුම හර කිරීමෙන් වූ වරද සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමේ දී අදාල වත්කම් ගිණුම හර කිරීම වෙනුවට ඌනතා හා අතිරික්තතා ගිණුම හර කර තිබුණි.

(ඔ) මීගමුව විද්‍යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් උපචිත වියදම් යටතේ වූ රු. 1,787,547 ක අධි වෙන් කිරීම සමාලෝචිත වර්ෂය තුල ජර්නල් සටහනක් මඟින් නිවැරදි කිරීමේ දී අදාල වත්කම් ගිණුම බැර කිරීම වෙනුවට ඌනතා හා අතිරික්තතා ගිණුම බැර කර තිබුණි.

(ඕ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට උපාධි පාඨමාලාවලට අදාලව ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම රු. 15,092,123 ක් වුවත් එකී විද්‍යාලවල ශේෂ සනාථයන් අනුව එම අගය රු. 33,725,250 ක් වූයෙන් රු. 18,633,127 ක නොසැසඳූ ශේෂයක් විය.

(ඇ) එකතු වටිනාකම රු. 773,033,994 ක් වූ වත්කම් බිඳුම් විෂයෙන් 11 කට අදාල විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ නෛතිකවිගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා තාරා විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවිර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් සැකීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල් කිරීමට හැකිවන පරිදි ප්‍රවේශිය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

පරීක්ෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවීම උසස් මට්ටමේ තහවුරුවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමෙදී හා තක්සේරු කිරීමෙදී අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, වියාජ ලේඛන සැකසීම, වේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

- 2018 අංක 19 දරණ රාජ්‍ය විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිර්ණායකය/විධානයට යොමුව	විස්තරය
(අ)2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත	
(I) 5 (1)(උ)වගන්තිය	පනත ප්‍රකාරව රාජිත පිවර හා සමුද්‍රීය ආයතනය ඇතුළුව ආයතන පිහිටුවීම සම්බන්ධීය වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබුණි. එහෙත් යාත්‍රා ප්‍රහුණුව සඳහා අනුමත කාර්ය මණ්ඩලයෙන් 12 දෙනෙකු හා ඊට අදාළ උපකරණ ඒකක 13 ක් ප්‍රාදේශිය විද්‍යාල වල උගන උපයෝගීකව තැබීමේ අතර ස්ථිර සේවක මණ්ඩලය වෙනුවෙන් සම්බන්ධීය වර්ෂය තුළදී රු. 7,858,254 ක් වැටුප් හා දීමනා වෙන් කිරුණි.
(II) 5 (1)(ඒ) වගන්තිය	විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ ප්‍රහුණු වැඩසටහන් සඳහා කෙරුණු අය කර ගත හැකි වුවත් පවත්වනු ලබන පාඨමාලා හා ප්‍රහුණු වැඩසටහන් වෙනුවෙන් 2017 වර්ෂයේ සිට කෙරුණු අය කිරීමක් සිදුකර නොතිබුණි. අවසන් වරට 2016 වර්ෂයට අදාළ කෙරුණු අය කර තිබූ අතර එකී වර්ෂයට අදාළ බිල් කල ආදායම රු.මිලියන 19.8 ක් විය.
(III) 10.3 හා 18 වගන්ති	කුලපතිවරයා, පීඨාධිපතිවරු යන තනතුරු නාමයන් සඳහා පුද්ගලයන් පත් කිරීම සහ ඇතුලත් කිරීම, ප්‍රතිනත හා තන්ත්ව සහතික කිරීම සහාව, කාන්ත්‍රික සභාව, පීඨවල මණ්ඩල සහ මණ්ඩල පිහිටුවා නොතිබුණි.
(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2001 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅ/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පිරිවැය රු.769,630,000 ක් වූ ස්ථාවර වත්කම් හා පිරිවැය රු. 31,211,626 ක් වූ පරිගණක දුවාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනගත පවත්වා නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. <u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද විවිධ වූ පාඨමාලා / වැඩසටහන් 106 ක් සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 2376 ක් පමණ විය. මෙම වැඩසටහන් වලින් කෙටිකාලීන හෝ ජංගම වැඩසටහන් 72 ක් සිසුන් 1724 ක සහභාගිත්වයෙන් පවත්වා තිබුණු අතර එක් එක් වැඩසටහන් සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 7ත් - 25ත් අතර පරාසයක විය. එසේම ආයතනය විසින් පවත්වා තිබූ උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර යනාදී දිගුකාලීන පාඨමාලා 34 ක් සිසුන් 652 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වා තිබුණු අතර එම පාඨමාලා සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 7ත් - 50ත් අතර පරාසයක විය.

මෙලෙස සමාලෝචිත වර්ෂය තුල ඉටු කල කාර්යන් වෙනුවෙන් සාගර විශ්ව විද්‍යාලය විසින් දරා ඇති කාර්යාලයේ සේවක මණ්ඩල වියදම රු. 226,204,042 ක් හා අනෙකුත් පුනරාවර්තන වියදම රු. 104,696,296 ක් වී තිබුණි.

(ආ) (i) සමාලෝචිත වර්ෂය තුල විද්‍යායතන 07 ක ඩිප්ලෝමා පාඨමාලාවන් 03 කට සිසුන් 210 දෙනෙකු බඳවා ගැනීමට සැළසුම් කලද විද්‍යායතන 06 ක පාඨමාලා 02ක් සඳහා සිසුන් 118 ක් පමණක් බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ත්‍රිකුණාමලය විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට සැළසුම් කර නොතිබුණු අතර විද්‍යායතන 04 ක සිසුන් 95 කගේ සහභාගිත්වයෙන් ආරම්භ කිරීමට සැළසුම් කර තිබූ පාඨමාලා 03 ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු අයදුම් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල විද්‍යායතන 08 ක සහතික පත්‍ර පාඨමාලාවන් 08 කට සිසුන් 442දෙනෙකු බඳවා ගැනීමට සැළසුම් කර තිබුණද සිසුන් 303 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. විද්‍යායතන 06 ක සිසුන් 170දෙනෙකුගේ සහභාගිත්වයෙන් ආරම්භ කිරීමට සැළසුම් කර තිබූ පාඨමාලා 08 ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු අයදුම් කර නොතිබුණි. මීට අමතරව විද්‍යාල 03 ක සැළසුම් නොකල පාඨමාලා 02 ක් සිසුන් 56 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වා තිබුණි.

ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම හා අනෙකුත් පහසුකම් අවම වීම පාඨමාලා නොපැවැත්වීම සඳහා හේතු වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පවරා ගෙන තිබුණද එම ආයතනය ආරම්භයේ සිට පරිහරණය කරමින් පැවතුණි. ප්‍රධාන කාර්යාලය ඇතුලුව ප්‍රාදේශීයව පිහිටි විද්‍යාල 08 ක ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් වල අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අත්තිකාරම් ශේෂය තුල ඇතුළත් 2012 වර්ෂයට පෙර පිට පැවත එන නිරවුල් නොකරන ලද රු. 3,742,168 ක ශේෂයක් ද 2002 – 2014 කාලපරිච්ඡේදයට අදාලව නාරා ආයතනයන් ලැබිය යුතු රු. 1,329,343 ක් ද 2012 වර්ෂයේ දී ලබා දී ඇති වැටුප් හා ගමන් වියදම් අත්තිකාරම් එකතුව රු. 131,500 ක් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේ දී රු.මිලියන 14 ක් පමණ වැය කර ඉදි කර තිබූ මඩකලපුව සංචාරක නිවාසය සඳහා 2017 වර්ෂයේ දී ද වැඩ සහ ලී බඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා එකතුව රු.මිලියන 7 ක් ද වැය කර තිබුණි. එහෙත් මෙම හොඩහැබිල්ල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයට හෙන හොබවිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී සුරක්ෂාවූ 147 ක් පැවතුණ අතර හෙෙන්ත්‍රාන් පදනම යටතේ 19 දෙනෙකු බඳවා හෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති සුරක්ෂාවූ වෙනුවෙන් අදාලව සහිර කථිකාචාර්යවරු / උපදේශකවරුන් 77 දෙනෙකුගේ සේවය ලබාහෙන ඒ වෙනුවෙන් රු. 5,129,825 ක් වෙලී කර තිබුණි.

ඩබ්ලිව්.ඒ.සී.චිත්‍රමරත්න

විගණකාධිපති

12. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

1.2.1 <u>තත්ත්වාගණනය කල මතය සඳහා පදනම.</u>

(අ) විගනිත කරුණ සමඟ එකඟ වෙමි. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේම, පුනරාවර්ථන ස්වභාවයේ වත්කම් ප්‍රාග්ධනිත වීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හදුන්වා දී ඇත.

(ආ) විගණිත කරුණ සමඟ එකඟ වෙමි. දීර්ඝ කාලීනව සමුච්චිත ක්ෂය කර අවසන් හා භාවිතයට නොගන්නා වත්කම් ලේඛනයෙන් ඉවත්කර ඇත. එය ජර්නල් සටහන් 163 මඟින් සිදුකර ඇත.

(ඇ) විගණකාධිපති දෙපාර්මේන්තුව විසින් 2012 වර්ෂයේ සිට 2018 දක්වා විශ්වවිද්‍යාලයේ විගණනය සිදුකළ ද ඒ සඳහා ගෙවීම් සිදු කිරීමට කිසිදු මුලාශ්‍ර ලියවිල්ලක් විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබුනි. 2018 වර්ෂය වන විට විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබූ ශේෂය 2018 වර්ෂයේ දී ගෙවීම් සිදුකිරීම සඳහා අදාල වෙන් කිරීම සිදුකර ඇත.

(ඈ) අදාල ක්ෂය ඇතුලත් කර ඇත්තේ එකී වත්කම අවසන් ගිණුම් තුල ඇතුලත් කළ දින සිට 2018 අවසන් වර්ෂය සඳහා වේ . 2018.12.31 දිනට සමුච්චිත ක්ෂය නිවැරදි කර ඇත.

(ඉ) නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(ඊ) විගණිත කරුණ සමඟ එකඟව නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(උ) විගණිත කරුණ සමඟ එකඟව නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(ඌ) විගණිත කරුණ සමඟ එකඟව නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(එ) ඉදිරියේ දී මෙකී තත්ත්වයන් ඇති නොවීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර ඇත.

(ඒ) 2011 වර්ෂය දක්වා අවස්ථා කිහිපයක දී විගණකාධිපතිවරයා විසින් අවසන් ගිණුම් වාර්තා සම්බන්ධව මතයක් ප්‍රකාශ නොකළ අතර 2012 වර්ෂයේ සිට තත්ත්වාගණනය කළ මතය යටතේ ගිණුම් වාර්තා සම්බන්ධව මතය ප්‍රකාශයට පත් කර ඇත.

බාහිර විගණන ආයතනයක් වන අමරසේකර සහ පුත්‍රයෝ නැමති විගණන ආයතනය විසින් විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන ජංගම ගිණුම් පරීක්ෂා කර වාර්තාවක් නිකුත් කළ බවත් එම වාර්තාවේ ඇතුලත් වූ අහරු වූ වෙක්පත් කිහිපයක් සම්බන්ධව කටයුතු කරමින් එවකට රු.600,000.00 ශේෂය ඉක්මවූ අවිනිශ්චිත ගිණුම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ එකඟතාවකින් අදාල නිවැරදි කිරීම් සිදුකළ බවත් ඒ අනුව අවිනිශ්චිත ගිණුමේ පැවැති ශේෂය වූ (රු.85,433.00)

අගය 2012 වර්ෂයේ සිට ඉදිරියට නොවෙනස්ව පවත්වාගෙන යාමේ එකඟතාවය මත එකී වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් මතය ප්‍රකාශ කල බවත් මේ දක්වා එකී අගය නොවෙනස්ව 2012 සිට 2018 වසර දක්වා පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇති නමුදු 2019 වර්ෂයේ දී මෙම ශේෂය ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු යොදනු ඇත.

(ඔ) විගණිත කරුණු සමඟ එකඟ වන අතරම මෙම ප්‍රාග්ධන වියදම් සම්බන්ධව මූලික තොරතුරු විගණකාධිපති දෙපාර්තමේන්තුව සතුව පවතින බැවින් අදාල ලිපි ගොනු ලද විගසම නිවැරදිව වියදම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කර 2019 අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඕ) මෙම කරුණු සමඟ එකඟ වන අතර රු 33,725,250.00/= අගය සඳහා ශේෂ සනාථයන් ලබාගෙන ඇත්තේ මෙම ගැටළුකාරී තත්ත්වයට පූර්ව සුදානමක් ලෙසින් වේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සිසුන්ගෙන් ගාස්තු අයකර ගැනීමකින් තොරව අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී ඇති අතර එතෙක් අධ්‍යාපනය ලැබූ සිසු සිසුවියන් විසින් ගෙවිය යුතු පාඨමාලා ගාස්තු අදාල අංශ මඟින් තහවුරු කිරීමෙන් පසු ගිණුම් ගතකර ඇත්තේ උපචිත පදනමනි. මෙකී තොරතුරු නැවත තහවුරු කර ගැනීම සඳහා විධිමත් ලෙස ආකෘති පත්‍රයක් සකසා ඉදිරිපත් කර අදාල තොරතුරු ලබා ගෙන ඇත. 2017 වසර දක්වා අධ්‍යාපනය ලැබූ සිසු සිසුවියන්ගෙන් අය විය යුතු පාඨමාලා ගාස්තු අය කර නොගන්නා ලෙස මෙතෙක් අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමින් දැනුම් දීමක් කර නොමැති බැවින් රු 9,841,123.00 ක් වූ ශේෂය ජනිත කරවා ගිණුම්ගත කර ඇත .

එසේම උසස් අධ්‍යයන අංශ ප්‍රධානීන්ගේ දැනුම් දීම පරිදි සිසුන් විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු හිඟ පාඨමාලා ගාස්තු ගෙවීම් සිදුකර නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. එසේම, 2019 වර්ෂයේ දී මෙම පාඨමාලා ආදායම් අයකර ගත යුතු බව රජය විසින් තීරණය කර ඇති බැවින් 2019 වර්ෂයේදී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරුණු ලැබේ.

(ක) විගණන විමසුමේ සඳහන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනයට සම්බන්ධිත;

01. Refundable Deposits-(Electricity NARA)- රු.218,750.00
02. NARA (Refundable) - රු.180,000.00
03. Refundable Deposits - (Vehicle Rent) - රු.47,000.00

කරුණු අරභයා 2019.05.22 දින අංක OCU/02/02/01-07 දරණ ලිපිය අදාල ආයතනයට යොමු කරන ලදී. පැවති තත්ත්වය වනුයේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය සමඟ විශ්වවිද්‍යාලය 2002 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල විවිධ සේවා ලබා ගැනීම වෙනුවෙන් එම ආයතනය වෙත තැන්පත් කරන ලද තැන්පතු මුදල් නිදහස් කර ගැනීම හා යාවත්කාලීනව පවත්වා ගෙන යන තැන්පතු ශේෂයයන් තහවුරු කර ගැනීම යන කරුණු වේ. මේ හා සබැඳි ලිපි 02 ක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනයේ ගණකාධිකාරී වෙත 2018.03.21 දිනැතිව ද, 2017.12.31 දිනට **"ලැබිය යුතු ශේෂයන් සහතික කිරීම"** මැයෙන් ද ලෙස එවක අධ්‍යක්ෂ මුදල් (වැ.බ.) විසින් යොමු කර විමසීම් කර ඇත. කෙසේ වුවද 2019.05.22 දින

යොමු කරන ලද ලිපියට එම ආයතනය ප්‍රතිචාර දක්වන ලද වහාම අදාල පිලිතුරු කඩිනමින් ඉදිරිපත් කරනු ලැබේ.

Refundable Hostel Fees - රු 110,000.00

මෙකී ශේෂය ද ඉදිරියේ දී මුල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කර කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කරනු ඇත.

උපචිත වියදම් - රු 30,535,021.00

මෙම ශේෂය ජනිත වී තිබෙනුයේ උප ලේඛන සහිතව උපචිත වියදම් ගිණුම් ගත කිරීම් සිදු කිරීම හේතුවෙනි. එබැවින්, ජර්නල් සටහන් මඟින් මෙම සියළු ගිණුම් ගත කිරීම් කර ඇත. මෙකී ශේෂය සනාථ කිරීම සඳහා වූ ලේඛනය නොපමාව ලබා දීමට කටයුතු කර නිවැරදි කරනු ඇත.

වත්කම් ගිණුම් ශේෂයන්

මෙම වත්කම් ශේෂ සනාථ කිරීම සඳහා උපලේඛනය වනුයේ ස්ථාවර වත්කම් ලේඛනයයි. කෙසේ වෙතත් මෙකී ගෙවීම් සිදුකිරීමේ දී ලේජර් ගිණුම් තුල ඇතුලත් වන අතර එම ශේෂයන් ඇතුලත් ශේෂ පිරික්සුම පදනම්ව අවසන් ගිණුම් සකසනු ලැබේ. එහිදී ලේජර් ගිණුම් මෙකී ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අවශේෂ මූලාශ්‍ර ලියවිල්ලක් ද වේ. කෙසේ වුවද විධිමත්ව සකසන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් 2019 අවසන් ගිණුම් වාර්තාව සමඟ යොමු කිරීමට කටයුතු කරනු ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ)) i. 2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 5.1(ඌ) වගන්තිය යටතේ Sea Training Vessel Maintenance Unit නමින් අංශයක් නොමැත. එම ප්‍රශ්නය නිවැරදි විය යුතුය.

ii. 1.2.4 පිලිතුර අදාල වේ.

Travelling Advanced - රු 15,000.00

මෙම ශේෂය 2011 වර්ෂයේ සිට නොව 2012 වර්ෂයේ සිට පැවැති ඇති අතර සංයුක්ත දීමනා සම්බන්ධව ලබාගත් අත්තිකාරමක් වේ. මේ වන විට පියවීම් සිදුකර නිබුණද ගිණුම් සටහන් මුදල් පොතට ඇතුලත් කිරීමේ දෝෂයක් හේතුවෙන් විගණිත කරුණු මතු වී ඇත. අදාල උපලේඛණ සමඟ ජර්නල් සටහනක් මඟින් 2019 වර්ෂයේ දී මෙම ශේෂය ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු යොදනු ලැබේ.

(iii) විශ්වවිද්‍යාලය සඳහා කුලපතිවරයා පත් කිරීම පිළිබඳ ලිපිය මේ වන විටත් ජනාධිපතිතුමා වෙත යොමු කර ඇත. නියෝජ්‍ය උපකුලපතිවරයා බඳවා ගැනීම මේ වන විට විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව වර්ධනය වීම හා පීඨ සංඛ්‍යාව මත ඉදිරියේදී තීරණය වනු ඇත.

මණ්ඩපාධිපතිවරු පත්කිරීම සඳහා මණ්ඩප පිහිටුවා නොමැත. පීඨාධිපතිවරු බඳවා ගැනීමේ කටයුතු සඳහා 2020 මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.

මාධ්‍ය හා තොරතුරු සේවා අධ්‍යක්ෂ තනතුර සහ ඇතුලත් කිරීම් ප්‍රතීතන හා තත්ත්ව සහතික කිරීමේ සභාවේ ප්‍රධානියා දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෝ ඊට ඉහළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු පත් කළ යුතු තනතුරු වන අතර, බාහිර බඳවා ගැනීමක් අවශ්‍ය නොවේ.සේවා අවශ්‍යතාවය අනුව එම පත් කිරීම සිදු කරනු ඇත.

අන්තර් ශාස්ත්‍රීය සභාවක් මේ වන විට ක්‍රියාත්මක වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩල හා පීඨාධිපති පත් කිරීම් සම්පූර්ණ වූ පසු ස්ථිර ශාස්ත්‍රීය සභාව පත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) (උ) හි පිළිතුර අදාල වේ.

3. <u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>

(අ) සමාලෝචිත වර්ෂය තුළ උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම් සැලසුම් කල පරිදි ඉතා කාර්යක්ෂමව සිදුකරමින් පවතී. උපාධි පාඨමාලා සඳහා ඇතුළුවන ශිෂ්‍ය ලියාපදිංචිය වර්ධනය සඳහා විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරමින් පවතින අතර පෙර වර්ෂ සමඟ සැසඳීමේදී වර්තමානයේ වර්ධනයක් පෙන්වනු ලැබේ. ඉදිරියේ දී මෙම තත්ත්වය මත වැඩි ඉල්ලුමක් ඇති නව පාඨමාලා හඳුන්වා දීමටත් වර්තමානයේ පවත්වාගෙන යන උපාධි පාඨමාලාවල ගුණාත්මක භාවය වර්ධනයටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) i. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 07ක පවත්නා ඩිප්ලෝමා පාඨමාලාවන් 03ක් සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට සැලසුම් කර තිබුනද පාඨමාලා 02ක් පමණක් ඇරඹීමට හේතුවූයේ අනෙකුත් පාඨමාලාවන්ට අවශ්‍ය ස්ථිර හෝ බාහිර උපදේශකවරුන් බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙනි.

ත්‍රිකුණාමලය මධ්‍යස්ථානය සතුව ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යාමේ අවම සුදුසුකම් හෝ නොමැතිවීම මත ඩිප්ලෝමා පාඨමාලා සැලසුම් නොකරන ලදී.

සිසුන් බඳවා ගැනීම අවම වීමට හේතුවූයේ සහ සැලසුම් කළ ඇතැම් පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වූයේ, අධ්‍යයන කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම මත එම පාඨමාලාවන් සඳහා අවශ්‍ය උපදේශකවරුන් බඳවා ගැනීමට නොහැකි වීම මතය.

මේ වනවිට කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන්ගේ සේවය යොදාගනිමින් උපරිම වශයෙන් සාර්ථකව පාඨමාලා පවත්වාගෙන යාමට ක්‍රියා කර ඇත.

ii. සැලසුම් කළ සහතික පත්‍ර පාඨමාලා ආරම්භ කිරීමටද ඉහත උපදේශකවරුන්ගේ ගැටළුව හේතු වී ඇත.

සැලසුම් නොකල පාඨමාලා ආරම්භ කිරීමට හේතුවූයේ ඒ සම්බන්ධයෙන් වූ විශේෂ ඉල්ලීම් වේ.

ශිෂ්‍ය ඉල්ලීම් අවම වූ පාඨමාලාවන් හඳුනාගෙන ඇති අතර එම පාඨමාලාවන්ගේ තත්ත්වය උසස් කිරීමටත් වැඩි ඉල්ලුමක් සහිත පාඨමාලාවන් හඳුන්වා දෙමින් ඉදිරියේදී එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමටත් සැලසුම් කර ඇත.

පුවත් පත් දැන්වීමේ සඳහන් ඇතැම් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ඇතැම් පාඨමාලා පැවැත්වීම අතහැර ඇත්තේ එම පාඨමාලා පැවැත්වීමේ පහසුකම් එම මධ්‍යස්ථාන සතුව නොමැතිවීම හේතුවෙනි.

ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08ක් ක්‍රියාත්මක වූවද එයින් 04ක එකදු ස්ථිර උපදේශකවරයකු හෝ නොමැතිවීම පාඨමාලා සාර්ථකව පැවැත්වීමට බලවත් බාධාවක්ව පවතී. එම අඩුපාඩුව සැපිරීම සඳහා බාහිර සහ කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශකවරුන් බඳවාගෙන අධ්‍යයන කටයුතු සිදු කළද ඔවුන් ස්ථිර සේවකයින් නොවන බැවින් ඔවුන් වෙතින් ද පාඨමාලා ප්‍රවර්ධන කටයුතු සඳහා විශාල දායකත්වයක් නොලැබීම මෙම තත්ත්වයට බලපා ඇත.

තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් වැඩි වෘත්තීය පුහුණු පාඨමාලා සංඛ්‍යාවක් පැවැත්වීමට හැකියාව තිබුනද එම මධ්‍යස්ථානයේ ප්‍රධාන ගොඩනැගිලි තුළ උපාධි පාඨමාලාවන්ද පවත්වාගෙන යන බැවින් ප්‍රමාණවත් පංති කාමර පහසුකම් නොමැතිවීම පාඨමාලා ආරම්භ කිරීමට ගැටළුවක්ව පවතී.

(ඇ) ඉදිරියේදී කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරනු ඇත.

(ඈ) 1.2. හි පිළිතුර (ක) අදාල වේ.

(ඉ) වර්තමානය වන විට මෙම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කර සඵලදායී ලෙස භාවිතයට ගෙන ඇත.

(ඊ) කාර්ය මණ්ඩල 21 අතිරික්තයක් නොමැත. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අනුමත කාර්ය මණ්ඩලය හා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සිටි සේවකයන් ඔවුනට පෞද්ගලික වන සේ අන්තර්ග්‍රහණය කිරීමේදී මෙම සංඛ්‍යාත්මක තත්ත්වය උද්ගතව ඇත. 2019 වර්ෂයේ විශ්වවිද්‍යාලය සඳහා අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගෙන ඇත.අනෙකුත් කාර්ය මණ්ඩලය 2020 වර්ෂයේ බඳවා ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.

වෘත්තීය පුහුණු අංශයේ උපදේශකවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල 2020 වර්ෂයේ බඳවා ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. ඔවුන්ගේ අන්තර්ග්‍රහණ කටයුතු 2019 මැදහාගය දක්වා සම්පූර්ණ නොවී පැවති බැවින් 2018 වර්ෂයේ පුරප්පාඩු පිරවීමට හැකියාවක් නොමැති විය.

මහාචාර්ය.එන්.පී.රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

මහාචාර්ය එන්.පී. රත්නායක
BSc (Hons.), MSc (Japan), PhD (Japan), (Cgoel)
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
කාක දුපත, කොළඹ 15.